# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,622 – 2009 ඔක්තෝබර් මස 02 වැනි සිකුරාදා – 2009.10.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස : (II අ) වැනි ඡේදය - පළකිරීම්

## තනතුරු – ඇබෑර්තු

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — හම්බන්තොට දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාල උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපලක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩි නොවිය යුතුය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථාන වල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2009 ඔක්තෝබර් මස 30 දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 සැප්තැම්බර් මස 01 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| හම්බන්තොට | බෙලිඅත්ත | ගැටමාන්න කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ දකුණු ගිරුවා පත්තුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට |

10-17

---

### අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට සහකාර නීති කෙටුම්පත් සම්පාදකවරුන් බඳවා ගැනීම - 2009

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති, ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයඳුම්පත්‍ර කැඳවනු ලැබේ.

01. *වයස් සීමාව* :
ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 25 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තැනැත්තන්ට උපරිම වයස් සීමාව බලනොපානු ඇත.

02. *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්* :
ඉල්ලුම්කරු—
(i) ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් බඳවාගනු ලැබූ තැනැත්තකු විය යුතුය;

සහ

(ii) සිංහල හෝ දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථයක් සහිතව සහ ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් යටත් පිරිසෙයින් විෂයයන් හයකින් සමත් ව තිබිය යුතුය.

03. *වැටුප් පරිමාණය.*—මෙම තනතුරට රු. 28,095 - 5 x 645 - 5 x 790 - 15 x 1,050 - රු. 51,020 මාසික වැටුප් ප්‍රමාණය හිමි ය. (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 යටතේ (S. L.— 5-2006) වැටුප් පරිමාණය).

04. (අ) *බඳවා ගැනීමේ ක්‍රමය* :
ඉහත සුදුසුකම් සහිත අපේක්ෂකයින් විසින් ඉදිරිපත් කරනු ලැබූ අයදුම්පත් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අපේක්ෂකයින් තෝරා ගැනීම සිදුකෙරෙන අතර, එහි දී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද පහත දක්වා ඇති ලකුණු දීමේ ක්‍රමය පදනම් කරගනු ලැබේ.

| | *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙහි ලකුණු දීමේ පටිපාටිය* | *මුළු ලකුණු* |
|---|---|---|
| 01. | සාමාන්‍ය නීති මූල ධර්ම - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ අර්ථ නිරූපන ආඥාපනතෙහි විධිවිධාන ඇතුළු ව්‍යවස්ථා අර්ථ නිරූපනය පිළිබඳ නෛතික මූල ධර්ම | 30 |
| 02. | භාෂා ප්‍රවීණතාවය - (අතිරේක සුදුසුකම්) | |
| | අ.පො.ස. (සා/පෙළ) භාෂාව විෂයට සිංහල/දෙමළ/ ඉංග්‍රීසි යන භාෂා සඳහා අධි සාමාර්ථ ලබා තිබීම. (එක් විෂයකට ලකුණු 03 බැගින්) | 09 |
| | අ.පො.ස. (උ.පෙළ) විභාගයේ සිංහල/දෙමළ/ ඉංග්‍රීසි යන භාෂා සඳහා සාමාර්ථයක් හෝ ඉහත විෂයන් පිළිබඳව රජය පිළිගත් ආයතනයක පාඨමාලාවක් හදාරා විෂය පිළිබඳව ලබාගත් ඩිප්ලෝමා හෝ එවැනි සහතිකයක්. (මාස 06 කට වැඩි පාඨමාලාවක්) එක් භාෂාවකට ලකුණු 05 බැගින් | 15 |
| 03. | අතිරේක අධ්‍යාපන සුදුසුකම් - | |
| | (i) නීති ක්ෂේත්‍රයේ උපාධිය | 10 |
| | (ii) නීති ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධිය | 15 |
| | (iii) අනිකුත් ක්ෂේත්‍ර පිළිබඳ උපාධිය (භාෂා ක්ෂේත්‍රයේ නොවන) | 5 |
| 04. | පෞරුෂත්වය | 8 |
| 05. | පළපුරුද්ද නීතිඥ වෘත්තියේ වසර 02 ට වඩා පළපුරුද්ද (වර්ෂයකට ලකුණු 02 බැගින් වර්ෂ 04) | 8 |
| | එකතුව | 100 |

(i) සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන් පමණි.

(ii) සම්මුඛ පරීක්ෂණය සිංහල සහ ඉංග්‍රීසි/දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවන්ගෙන් පවත්වනු ලැබේ. අපේක්ෂකයින් භාෂා දෙකෙන්ම ප්‍රශ්න වටහාගෙන පිළිතුරු ලබා දීමේ හැකියාවෙන් යුක්ත විය යුතුය.

(iii) සමත් කිරීම සඳහා ලකුණු 40 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබා ගත යුතු ය. සමත් වූ අපේක්ෂකයින් අතරින් ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

(සම්මුඛ පරීක්ෂණයේ දී සියළුම සහතික පත්‍රවල මුල් පිටපත් හෝ නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.)

(ආ) *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :
මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

(ඇ) *සේවා කොන්දේසි* :
පත්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වූ ඡේදවලට යටත්වනු ඇත. බඳවා ගැනීම, සේවයේ යෙදවීම, විනය හා අනෙකුත් ආයතනික කටයුතු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසි සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන විධිවිධාන අදාල වේ.
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව තනතුරට බැඳී වසර 05 ක් ඇතුළත තනතුරට නියමිත දෙවැනි බස සඳහා භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

05. (අ) අයදුම්පත් 2009.10.23 දින හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු ය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
ලේකම්,
අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
උපරිමාධිකරණ සංකීර්ණය,
කොළඹ 12.

(ආ) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ (23cm x 25cm ප්‍රමාණයේ) කඩදාසියක සකස් කර ඉල්ලුම්කරු විසින් ම තමන්ගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය. (එහි මුල් පිටුවේ අංක 01 සිට 08 දක්වා වූ ඡේදවලට අදාළ විස්තරද, දෙවන පිටුවේ අංක 9 සිට 11 දක්වා වූ ඡේදවලට අදාළ විස්තර ද, තුන් වන පිටුවේ අංක 12(i) සිට 12(ii) දක්වා වූ ඡේද වලට අදාල විස්තර ද සඳහන් විය යුතු ය.)

(ඇ) අයදුම්පත්‍රය බහාලන කවරයේ වම් කෙළවරේ "නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(ඈ) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන, රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු/සාමාදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු හෝ රු. 20,030 කට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

(ඉ) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(ඊ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

06. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය* :
ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.
සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.
(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද හැඳුනුම් පත්‍රය.
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

07. *සාවද්‍ය තොරතුරු සැපයීම* :
ඔබ විසින් එවන ලද අයදුම්පතේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය බැව් හෝ වැරදි බැව් බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගවලට යටත්ව එම නිලධාරියාව සේවයෙන් පහකිරීමට කටයුතු කරනු ලැබේ.

අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය පරිදි,

එස්. කේ. ගම්ලත්,
ලේකම්,
අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.

2009 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ 12,
අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

(අයදුම්පත්‍රය පහත සඳහන් පරිදි පිළියෙල කළ යුතු ය)

(අ) ප්‍රමාණය : ඒ4 (සෙ. මී. 23 x 25)
1 පිටුව : අංක 1-8 දක්වා
2 පිටුව : අංක 9-11 දක්වා
3 පිටුව : අංක 12 (i) - 12 (ii) දක්වා

*සහකාර නීති කෙටුම්පත් සම්පාදකවරුන් බඳවා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය*

01. නම :
(අ) මුලකුරු සමග අගට යෙදෙන නම :———.
(මහතා/මිය/මෙනෙවිය) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
සිංහලෙන්/දෙමළෙන් :———.
(ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම :- (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
සිංහලෙන්/දෙමළෙන් :———.

02. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් ලිපිය එවිය යුතු ලිපිනය :
ඉංග්‍රීසි කැපිටල් අකුරින් :———.
සිංහලෙන්/දෙමළෙන් :———.

03. ස්ථිර ලිපිනය :———.
එය අයත් දිස්ත්‍රික්කය :———.

04. ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ -1 / ස්ත්‍රී - 2 ☐

05. ඔබ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල සහ ඉංග්‍රීසි - 1
දෙමළ සහ ඉංග්‍රීසි - 2 ☐

06. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග :
ඔව් - 1
නැත - 2 ☐

07. ජාතික හැඳුනුම්පත් අංකය :———.

08. උපන් දිනය :
වර්ෂය :———. මාසය :———. දිනය :———.

09. (i) වෘත්තීය හා අනෙකුත් සුදුසුකම් :———.
(ii) දෙවන භාෂාව පිළිබඳ ලබා ඇති ඉහළම සුදුසුකම :———.
(iii) පළමු භාෂාව පිළිබඳව ඔබ ලබා ඇති ඉහළ සුදුසුකම :———.
(අ.පො. ස. (සා.පෙ/උ. පෙ.) විභාග වලින් නම් වර්ෂය හා ඔබ ලැබූ ශ්‍රේණිය (සම්මාන/විශිෂ්ඨ) සඳහන් කළ යුතු වේ.)
(iv) (i) උපාධි සුදුසුකම් :

| *උපාධිය* | *විෂයන්* | *සාමාර්ථය (පන්තිය)* | *වර්ෂය* | *විශ්ව විද්‍යාලය* |
|---|---|---|---|---|
| | | | | |

(ii) *පශ්චාත් උපාධි සුදුසුකම්* :

| *පශ්චාත් උපාධියේ නම* | *උපාධිය පිරිනමන ලද වර්ෂය* | *විශ්ව විද්‍යාලය* |
|---|---|---|
| | | |

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.*

*ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 ඔක්තෝබර් මස 09 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2009 සැප්තැම්බර් මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.*

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

(v) නීතිඥ වෘත්තියේ පළපුරුද්ද :———.
(සේවා සහතිකයක් ඇමිණිය යුතු ය.)

10. අධිකරණයක් ඉදිරියේ ඔබ කිසියම් වරදකට වරදකරු වී ඇද්ද :- ඔව්/නැත. ඔව් නම් ඒ පිළිබඳ විස්තර සපයන්න. :———.

11. අයදුම්කරුගේ සහතිකය :-
(අ) මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා පරිදි සත්‍ය හා නිවැරදි බව ගෞරව බහුමානයෙන් යුක්තව ප්‍රකාශ කර සිටිමි/දිවුරුම් දෙමි.
(ආ) ම විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බැව් හෝ වැරදි බැව් මා තෝරා ගනු ලැබීමට පෙර ඔප්පු වුවහොත්, මා නුසුදුස්සකු බවට තීරණය කරනු ලැබීමට හා පත්වීම ලැබීමෙන් පසු අසත්‍ය බැව් හෝ වැරදි බැව් ඔප්පු වුවහොත් කිසිඳු වන්දියක් නොමැතිව අදාළ ක්‍රියා මාර්ගවලට යටත්ව, සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද දැන සිටිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

12. i. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම
මෙම අයදුම්පත ඉදිරිපත් කරන...... මහතා/මහත්මිය/මෙනෙවිය මම පෞද්ගලිකව හඳුනන බවත් ඔහු/ඇය 2009 ... මස... දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් මෙයින් සහතික කරමි.

———.
සහතික කරන්නාගේ අත්සන

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :———.
තනතුර :———.
ලිපිනය :———.
දිනය :———.

12. ii. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය
අයදුම්කරු/අයදුම්කාරිය ඉහතින් සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, නිවැරදි බවත් ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

———.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන.

පදවි නාමය :———.
දිනය :———.

10-98

---

**ශ්‍රී ලංකා රැකියා බැංකුව මගින් රැකියා ලබා දීමේ ජාතික ව්‍යාපෘතිය (www. Srilankajobs.net)**

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය (ICTA), ඊ- ශ්‍රී ලංකා සංවර්ධන වැඩ සටහන දියත් කිරීම සඳහා වගකීම් දරන රාජ්‍ය ආයතනය වන අතර එය ජාතිය වෙනුවෙන් තොරතුරු සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති මෙහෙයවීමේ හා සංවර්ධනය කිරීමේ නියුතු එකම ආයතනයද වේ. මේ ආයතනය යටතේ ක්‍රියාත්මක වන වැඩ සටහන් අතර ප්‍රධාන තැනක් උසුලන ඊ - සමාජ සංවර්ධන වැඩ සටහනෙහි අරමුණ වන්නේ සමාජයේ වරප්‍රසාද නොලත් සෑම ජන කොටසකටම තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ ප්‍රතිලාභ ළඟා කරදීමයි.

ශ්‍රී ලංකා රැකියා බැංකුව, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනයේ (ICTA) ප්‍රජා සහන ව්‍යාපෘතියේ ඊ - සමාජ සංවර්ධන වැඩ සටහන අරමුදල් යටතේ ක්‍රියාත්මක වේ. මෙය අන්තර්ජාල වෙබ් අඩවියක් ලෙස ක්‍රියාත්මක වන අතර රාජ්‍ය අංශයේ රැකියා, පුද්ගලික අංශයේ රැකියා, රාජ්‍ය අංශයේ සුහද මාරුවීම්, දේශීය සහ විදේශීය රැකියා අවස්ථා සඳහා අපේක්ෂකයින් යොමු කිරීම මෙම වැඩසටහනෙහි මූලික අරමුණයි.

රැකියා අපේක්ෂිකයින්ගේ දත්ත අන්තර්ජාල ගත කොට සෘජුවම එම ආයතනය සමග සම්බන්ධ වීමෙන් රැකියා අවස්ථාවන් වලට යොමු කිරීම කඩිනම් කෙරේ. අපේක්ෂකයින්ගේ ජීව දත්ත අන්තර්ජාලයට ඇතුළත් කිරීමෙන් සහ සෘජුවම ආයතන සඳහා රැකියා අපේක්ෂිකයින්ගේ සුදුසුකම් මත ඔවුන් යොමු කිරීම මගින් කෙටි කාලීන රැකියා ලබා දීමේ ව්‍යාපෘතියකි.

**ඔබට අයදුම් කළහැකි රැකියා අවස්ථාවන්**

පෙර පාසල් ගුරු තනතුර
පෙර පාසල් සහායිකා තනතුර
තැපැල් සේවා නිලධාරි
සිංහල ටයිප් සෙටින් ක්‍රියාකරුවන්
බිල් ලියන්නන්

පිළිගැනීමේ නිළධාරී
වයරින් බාස්වරුන්
ලිපිකාරිණියන්
පරිගණක දැනුම ඇති ලිපිකාරිණියන්
කොත්තු බාස්වරුන්
ෆාමසි ලිපිකරුවන්
හෙදියන්
වාහන විදුලි කාර්මිකයින්
පොටෝ කොපි යන්ත්‍ර අලුත් වැඩියා කරන්නන්
ටී මේකර්වරුන්
ෆාමසි බෙහෙත් නිකුත් කරන්නන්
පිරිසිදු කරන්නන්
ගෙවතු අලංකාර කරන්නන්
චැනල් සහයකයින්/සහායිකාවන්
ෆාමසි සහායක
වීදුරු යන්ත්‍ර ක්‍රියාකරුවන්
පෑස්සුම් කරුවන්
තහඩු වැඩ කාර්මිකයන්
ට්‍රැක්ටර් රියදුරන්
විශ්‍රාම ගිය රියදුරන්
කාර් රියදුරන්

වැඩ පරීක්ෂකවරුන්
වාහන පිරිසිදු කරන්නන්
වීදුරු කපන්නන්

වාහන මෝටර් විදුලි කාර්මික වරුන්
ටී. වී. රේඩියෝ, කැසට්, යන්ත්‍ර අලුත් වැඩියාකරුවන්
විදුලි ඉංජිනේරු කාර්මික ශිල්පීන්
ලැමිනේටර් යන්ත්‍ර ක්‍රියාකරුවන්
ස්ලිටර් යන්ත්‍ර ක්‍රියාකරුවන්
මෝටර් වාහන අලුත් වැඩියා අත්උදව්කරුවන්
සම්පල්රූම් ඇඳුම් මසන්නන්
කාර්යාල කාර්ය සහායක තනතුර
කම්කරු තනතුර
අලෙවි නිලධාරීන්
පරිගණක ක්‍රියාකරුවන්
ග්‍රැෆික් ඩිසයිනර්වරු
ආරක්ෂක නිලධාරීන්
රූපලාවන්‍ය ශිල්පීන්
මේසන් බාස්වරුන්
වේටර්වරුන්
හෝටල් පිරිසිදු කරන්නන්
බේකරි පිරිසිදු කරන්නන්
පුද්ගලික ලේකම්වරියන්
කෝකිවරුන්
චයිනීස් කෝකිවරු
රූම්බෝයි (පුහුණු/නුපුහුණු)
බේකරි බාස්වරුන්
ගෘහ සේවිකා
සාත්තු සේවිකා
මෝටර් සයිකල් මිකැනික්වරු
ඇලුමිනියම් වෑද්දුම්කරුවන්
ඉන්ජෙක්ටර් පොම්ප අළුත්වැඩියා කරුවන්
ඉංග්‍රීසි මාධ්‍ය පෙරපාසල් ගුරුවරු
ස්කැවේටර් රියදුරන්
අකුණු සන්නායක සවිකිරීම කාර්මික ශිල්පීන්
ගෘහ භාණ්ඩ පින්තාරුකරුවන්
M. D. F. භාණ්ඩ නිෂ්පාදන කරුවන්
ග්‍රිල් ගේට්ටු නිෂ්පාදකයින්
ලොරි රියදුරන්
බැකෝ යන්ත්‍ර ක්‍රියාකරුවන්
ජෙනරේටර් කාර්මිකවරුන්

ස්පීන්ප්‍රින්ටින් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු
ඔප්සෙට් යන්ත්‍ර ක්‍රියාකරුවන්
කෝඩ් මැෂින් ක්‍රියාකරුවන්
කෝඩ් මැෂින් ක්‍රියාකරුවන්
විදුලි සංදේශ ඉදිකිරීම කාර්මික
එම්බ්‍රොයිඩර් ක්‍රියාකරුවන්
වායුසමීකරණ අළුත්වැඩියාකරුවන්
ෆැලැක්ලොට් මැෂින් ක්‍රියාකරුවන්
මෝටර් A/C අළුත් වැඩියාකරුවන්
පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු තනතුර
බැංකු ලිපිකරු තනතුර
දුරකථන ක්‍රියාකරු තනතුර
ඉංග්‍රීසි ටයිප් සෙටින් ක්‍රියාකරුවන්
වෙබ් අඩවි නිර්මාණ කරුවන්
කාර්යාල සහායක
වඩුබාස්වරුන්
වෙළඳ සේවක
පොලිෂ් බාස්වරුන්
ජලනල කාර්මිකයන්
ගෙවතු පිරිසිදු කරන්නන්
දිවා සුරැකුම් මධ්‍යස්ථාන සේවිකා
වෛද්‍ය මධ්‍යස්ථානවල බෙහෙත් නිකුත් කරන්නන්
හෙද සහායකයින්
ආයුර්වේද වෛද්‍යවරුන්
එක්ස්රේ ශිල්පීන්
ත්‍රිවිල් අළුත්වැඩියාකරුවන්
දන්ත සහායක
වෛද්‍ය රසායනාගාර සේවක

විදුලි කේබල් නිපදවන යන්ත්‍ර ක්‍රියාකරුවන්
වෙල්ඩින් කරුවන් MIG/TIG
ලියවන පට්ටල් කරුවන්
බෘම් ට්‍රක් රියදුරන්
කන්ටේනර් රියදුරු
ටයර් බාස්වරුන්
විදුලි උපකරණ අළුත් වැඩියාකරුවන්
බරවාහන රියදුරන්
ජේසිබී රියදුරන්
ටාටා ලේලන්ඩ් බස් රථ රියදුරුන්
ඇඟළුම් තත්ව පාලකවරුන්
මාකර් කටර් මිකැනික්වරුන්
සුපවයිසර්වරුන්
අයන් ඔපරේටර් වරුන්
ඇඟලුම් අත්උදව් කරුවන්
යකඩ වෑද්දුම් කරුවන්
ජුකී මැෂින් ක්‍රියාකරුවන්
වතුර පොම්ප අළුත්වැඩියාකරුවන්
ජුකී මැෂින් අළුත්වැඩියාකරුවන්

ඔබට අයදුම් කළහැකි රැකියා අවස්ථාවන් (Posts you can Apply for)

Admin/Support
Construction/Civil/Engineering
It/Software/Graphic
Sports/Recreation/Fitness
Beauty/Cosmatics
Hotels/Restaurants/Food
Store Keepers
Airline/Marine
Human Resources
Teaching/Academic/Library
Accountant
Eng/Mech/Auto/Elec
Other Opportunities
Media/Advert/Communication
Corporate Management
Legal/Law
Web Design
Customer Relations
Med/Healthcare/Nursing
Banking/Finance
Hospitality/Tourism
Textile and Apparel
Agriculture/Dairy
Fashion/Design
Production Supervision
Sales/Marketing/Merchandising
Foreign Employment
R & D/Lab/Technologist

ඉහත දැක්වෙන රැකියා අවස්ථාවන්ට යොමු කිරීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව සකසන ලද අයදුම් පත්‍රය 2009.12.31 දිනට පෙර පහත ලිපිනයට යොමු කරන්න. ඊ - ශ්‍රී ලංකා ප්‍රජා සහන ව්‍යාපෘතිය, ශ්‍රී ලංකා රැකියා බැංකුව, අංක 14, සෙවනගල.

01. මුලකුරු සමග නම
02. මුලකුරු වලින් හැඳින්වෙන නම්
03. ස්ථිර ලිපිනය
04. පරිපාලන දිස්ත්‍රික්කය
05. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
06. ග්‍රාම නිලධාරි වසම
07. උපන් දිනය
08. වයස : අවුරුදු මාස. දින
09. ජා. හැ. ප. අංකය
10. ස්ත්‍රී/පුරුෂ භාවය
11. විවාහක/අවිවාහක බව
12. උස
13. බර
14. විද්‍යුත් තැපැල
15. ස්ථාවර දුරකථන අංකය/පුද්ගලික දුරකතන අංකය
16. ඔබ සොයන්නේ දේශීය රැකියාවක් ද, විදේශීය රැකියාවක් ද යන වග
17. අපේක්ෂිත රැකියා අවස්ථා 04 ක් සඳහන් කරන්න
18. අධ්‍යාපන සුදුසුකම්
19. භාෂා නිපුණතාවය
20. වෘත්තීය සුදුසුකම්
21. වෘත්තීය පළපුරුද්ද

10-168

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ශ්‍රී ලංකා පුස්තකාලයාධිපති සේවයේ III වැනි ශ්‍රේණියේ හා II වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2009**

1997.11.19 වැනි දින හා අංක 1002/13 දරන ශ්‍රී ලංකා රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා පුස්තකාලයාධිපති සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ 09 වන හා 10 වන ඡේදයන්හි විධිවිධාන අනුව ශ්‍රී ලංකා පුස්තකාලයාධිපති සේවයේ II වැනි ශ්‍රේණියේ හා III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාග 2010 ජනවාරි මස කොළඹ දී පවත්වනු ලැබේ.

02. (i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටතේ වේ.
(ii) අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති *ගැසට් නිවේදනය* ආරම්භයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවම්වලට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

03. මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පත්‍රය මෙම නිවේදනය අවසානයේ පළ කර ඇත. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතු අතර, නිවැරදිව හා පැහැදිලිව පිළියෙල කළ අයදුම්පත තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2009 නොවැම්බර් මස 03 දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, සංවිධාන සහ විදේශ විභාග ශාඛාව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාගයේ නම සහ ශ්‍රේණිය සඳහන් විය යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරනු ඇත.

04. හැඳුනුම්පත් - අපේක්ෂකයන් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයක්ම පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරින් කුමක් වුවත් භාර ගනු ලැබේ.
(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය (පාස්පෝට් බලපත්‍රය) ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකි ය.

*අයදුම්පත්‍ර* - අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 1.0 සිට 5.0 තෙක් ඡේද පළමුවන පිටුවට ද 6.0 සිට 9.0 තෙක් ඡේද දෙවන පිටුවට ද වන ලෙස ගෙන අයදුම්පත්‍ර 8" x 12" ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කරගත යුතුය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙල කර ගත හැකි වුවද, එය අයදුම්කරුගේ අත් අකුරින් ම පිරවිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාග අයදුම් පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කරන්න. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ.

පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතෙකුදු වුවත් ඉන්පසු වාරවල දී නිලධාරීන් විසින් එක්වර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් රු. 175 ක් ද, එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් රු. 90 ක් ද, විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතුය. විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 4000-20-03-20-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබාගත් මුදල් භාරගැනීමේ කුවිතාන්සියක් අයදුම්පතේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. කුමන කරුණක් යටතේ වුව ද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයට මාරු කිරීමට ඉඩදෙනු නොලැබේ. කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

06. අදාළ පරිදි විභාග ගාස්තු ගෙවා, නිසි ලෙස ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ කර, නියමිත දිනට හෝ ඊට පෙර එවා ඇති නිලධාරීන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහන් පිටපතක් සමග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලැබේ. විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් විසින් විභාග ශාලාධිපති වෙත අත්සන සහතික කරවා ගත් ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශපත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ හා අදාළ නම් මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

07. විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍රයක් ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතුය. ගමන් වියදම් ගෙවනු නොලැබේ.

08. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් මෙම විභාගය පැවැත්වෙන අතර අපේක්ෂකයන් අදාළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ ප්‍රශ්න පත්‍ර දෙකටම පිළිතුරු සැපයිය යුතු වේ. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුනු නිලධාරීන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ ප්‍රශ්න පත්‍ර දෙකට පිළිතුරු සැපයිය යුතුය. විභාගය සඳහා ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

09. එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවලදී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිවේ. එතෙකුදු වුවත් සාමාර්ථයක් සඳහා එක් එක් විෂයය සඳහා වූ ලකුණු වලින් අවම වශයෙන් සියයට හතලිහක් (40%) නිලධාරීන් විසින් ලබාගත යුතු වේ.

10. *විභාග ප්‍රතිඵල නිකුත් කිරීම* - විභාග ප්‍රතිඵල, විභාග කොමසාරිස් ජනරාල් විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරනු ලැබේ. සමත් වූ අයදුම්කරුවන්ගේ නම් ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබේ.

11. *විභාග පරිපාටිය* -

11.1 පුස්තකාලයාධිපති සේවයේ III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය—

1. *සාමාන්‍ය පරිපාලනය* - කාලය පැය 02 යි. (විෂයය අංකය 01) ලකුණු 100 යි. ආයතන සංග්‍රහයේ I සිට VIII දක්වා ද, XII, XIV, XXIV, XXVII, XXVIII, XXXI, XXXII, XXXIII පරිච්ඡේද ද ඇතුළත් වේ. (අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ *ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති ක්‍රියාත්මක වීමට පෙර පැවති තත්ත්වය අදාළ වේ.)
2. *මූල්‍ය ක්‍රම.*—කාලය පැය 02 යි (විෂයය අංකය 02) ලකුණු 100 යි.
*මුදල් රෙගුලාසි.*—1 වැනි කොටස (X වැනි පරිච්ඡේදය හැර) පුස්තකාලයාධිපති විසින් ඉටු කරනු ලබන ගිණුම් කටයුතු හා ඒවාට අදාළ රෙගුලාසි.

සැ. යු. මෙම පරීක්ෂණයෙන් සමත් වීම සඳහා එක් එක් විෂයය සඳහා වූ ලකුණුවලින් අවම වශයෙන් සියයට හතලිහක් (40%) ලබාගත යුතු වේ.

11.2 පුස්තකාලයාධිපති සේවයේ II වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය

1. *සාමාන්‍ය පරිපාලනය හා මූල්‍ය ක්‍රම* - කාලය පැය 03 යි. (විෂයය අංකය 03) මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ. ලකුණු 100 යි.

I වැනි කොටස : පරිපාලනය (කාලය පැය 1 1/2 යි) ලකුණු 50 යි.

(i) ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
(ii) ආයතන සංග්‍රහයේ I සිට VIII දක්වා ද, XIV, XXIV, XXV, XXVII, XXVIII, XXXI, XXXII, XXXIII පරිච්ඡේද ඇතුළත් වේ. (අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති ක්‍රියාත්මක වීමට පෙර පැවති තත්ත්වය අදාළ වේ.)
(iii) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ව්‍යවස්ථාපිත කිරීමේ පනත -714
(iv) ශ්‍රී ලංකා පුස්තකාල සේවා මණ්ඩල පනත
(v) බුද්ධිමය දේපළ පනත

II වැනි කොටස :- මූල්‍ය ක්‍රම (කාලය පැය 1 1/2 යි) - ලකුණු 50 යි.

(i) මුදල් රෙගුලාසි - 1 වැනි කොටස
(ii) පුස්තකාලයාධිපතින් විසින් ඉටු කරනු ලබන ගිණුම් කටයුතු හා ඒවාට අදාළ රෙගුලාසි

2. *පුස්තකාල සංවිධානය.*— කාලය පැය 03 යි (විෂයය අංකය 04) ලකුණු 100 යි.

(i) පුස්තකාල වර්ග හා සේවා;
(ii) පුස්තකාල සම්භාර හා සංවිධාන;
(iii) රජයේ ප්‍රකාශන හා ඒවායේ භාවිතය.

සැ. යු. මෙම පරීක්ෂණයෙන් සමත් වීම සඳහා එක් එක් විෂයය සඳහා වූ ලකුණුවලින් අවම වශයෙන් සියයට හතලිහක් (40%) ලබාගත යුතු වේ.

12. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සළසා නොමැති කවර කරුණක් පිළිබඳ වුව ද, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

බී. පී. පී. එස්. අබේගුණරත්න,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2009 සැප්තැම්බර් මස 17 වැනි දින,
ඒකාබද්ධ සේවා අංශය,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය.
කොළඹ 07.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

ශ්‍රී ලංකා පුස්තකාලයාධිපති සේවයේ III වැනි ශ්‍රේණියේ හා II වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2009
Efficiency Bar Examination For Officers in Grade III and II of the Sri Lanka Librarians' Service- 2009

ඔබ විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යය : (අදාළ අංකය කොටුව තුළ ලියන්න) (කාර්යාලීය ප්‍රායෝජනය සඳහා පමණයි)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

1.0 1.1 මුල'කුරු සමග නම :———. මයා/මිය/ මෙනවිය (සිංහලෙන්/දෙමළෙන්)
1.2 මුල'කුරුවලින් හැඳින්වෙන නම් :———. (සිංහලෙන්/දෙමළෙන්)
1.3 මුල'කුරු අගට යොදා මුල'කුරු සමග නම :———. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්, උදා :- (SILVA A. B.)

2.0 සේවා ස්ථානය හා ලිපිනය :———.
2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම :———.
2.2 රාජකාරී ලිපිනය :———. (ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

3.0 ස්ත්‍රී/පුරුෂ බව :
ස්ත්‍රී - 1
පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.0 ශ්‍රී ලංකා පුස්තකාලයාධිපති සේවයේ ඔබ ඉල්ලුම් කරන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ඉදිරියෙන් X ලකුණ යොදන්න.
4.1 පුස්තකාලයාධිපති සේවයේ III වැනි ශ්‍රේණිය
4.2 පුස්තකාලයාධිපති සේවයේ II වැනි ශ්‍රේණිය
4.3 ඔබ පෙනී සිටින විභාගයේ විෂයයන් සහ විෂයය අංක :

| *විෂයය* | *විෂයය අංකය* |
|---|---|
| | |
| | |

5.0 5.1 ජාතික හැඳුනුම්පත් අංකය :
5.2 උපන් දිනය : වර්ෂය : මාසය: දිනය :

6.0 දැනට දරන තනතුර
6.1 තනතුර :———.
6.2 පත්වීම් ලිපියේ අංකය :———.

7.0 7.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :———.
7.2 එසේ නොවන්නේ නම්, ඕනෑම තැපැල් කාර්යාලයකට විභාග ගාස්තුව ගෙවා ලබාගත් (අමුණා ඇති) මුදල් භාර ගැනීමේ කුවිතාන්සියේ;
අංකය :———. මුදල :———.
දිනය :———. නිකුත් කළ තැපැල් කාර්යාලය :———.

(මුදල් භාරගැනීමේ කුවිතාන්සිය නොගැලවෙන සේ අලවන්න.
(කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබාගන්න)

8.0 අයදුම්කරුගේ සහතිකය :
ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මා හට හිමිකම් ඇති බවත්, මොනයම් ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත්, ප්‍රකාශ කරමි. මෙම විභාගය සඳහා විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවා ඇති නීතිරීති පිළිපැදීමට ද එකඟ වෙමි.

———,
අයදුම්කරුගේ අත්සන

දිනය :———.

9.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය
(i) මෙම අපේක්ෂකයා/අපේක්ෂිකාව මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිටින පුස්තකාලයාධිපති සේවයේ II/III වැනි ශ්‍රේණියේ නිලධාරියෙකු/නිලධාරිණියක බව ද;
(ii) ඉහත සපයා ඇති විස්තර නිවැරදි බව ද;
(iii) ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සෑම විටම සතුටුදායක බව ද, පසුගිය පස් අවුරුදු කාලසීමාව තුළ (අවවාද කිරීම් හැර) කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට භාජනය නොවූ බව ද;
(iv) ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බව ද;
(v) නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බව ද (අදාල නොවේ නම් කපා හරින්න) මම සහතික කරමි.

———,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

පදවි නාමය :———.
ලිපිනය :———.
දිනය :———.
10-210

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

## බඩු බාහිරාදිය විකිණීම්

**දිසා අධිකරණය - බදුල්ල**

වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ නිර්දේශය මත වෙන්දේසි කිරීමට අනුමැතිය ලද භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

බදුල්ල, දිසා අධිකරණයේ 2007 වර්ෂයේ පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණයේ, සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය අනුව අධිකරණ ලේකම්ගේ අංක අධි/ගි/ඒ4/17/2007 දරන 2009.01.27 දිනැති හා 2009.02.25 දිනැති ලිපිය මගින් වෙන්දේසි කිරීමට අනුමැතිය ලද මෙයට යා කොට ඇති උපලේඛනයේ සඳහන් දේපළ 2009.10.23 වැනි දින පෙ.ව.. 10.00ට බදුල්ල, දිසා අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට ප්‍රථම වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැක.

03. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවන්හි අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ එම අවස්ථාවේදී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් සිදු කළ යුතු වන අතර, චෙක්පත් හා මුදල් ඇණවුම් භාර ගනු නොලැබේ.

05. වෙන්දේසියේ දී මිලදී ගනු ලබන අය විසින් තම අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කළ යුතුය.

දිසා විනිසුරු,
දිසා අධිකරණය - බදුල්ල.

2009 සැප්තැම්බර් මස 09 වැනි දින,
බදුල්ල, දිසා අධිකරණයේ දී ය.

2007 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය මත අධිකරණ ලේකම්ගේ අනුමැතිය ලද 2009 ඔක්තෝම්බර් මස 23 වැනි දින ප්‍රසිද්ධ වෙන්දේසියට නියමිත භාණ්ඩ උපලේඛනය

| *අනු. අංකය* | *භාණ්ඩ විස්තරය* | *ඒකක ප්‍රමාණය* |
|---|---|---|
| 01. | ලී අල්මාරි | 03 |
| 02. | වීදුරු සහිත ලී අල්මාරි | 02 |
| 03. | ලොකු ලී රාක්ක | 01 |
| 04. | ආරක්ෂිත ලී පෙට්ටි | 01 |
| 05. | ලී බන්දේසි | 04 |
| 06. | ලී මේසයක කොටස් | 02 |
| 07. | අබලන් විදුලි කේතල් | 01 |
| 08. | අබලන් හොට්ප්ලේට් | 01 |
| 09. | අබලන් බොයිලේරු | 01 |
| 10. | අබලන් කුඩා කතුරු | 01 |
| 11. | කැඩුනු පංචර් කැබලි | 02 |
| 12. | අබලන් කතුරු තහඩු | 01 |
| 13. | මල බැඳුනු සිල්වර් ට්‍රේ | 01 |
| 14. | මූඩිය රහිත ඇලුමිණියම් ලොකු කේතල | 01 |
| 15. | සිදුරු වී ඇති ඇලුමිණියම් ජෝග්ගු | 01 |
| 16. | අංක 95269 දරන ඔප්ටිමා (සිංහල) ගර්භිත යතුරු ලියන | 01 |
| 17. | 9008360 දරන ඔලිවිට්ටි (සිංහල) ගර්භිත යතුරු ලියන | 01 |
| 18. | HD35684 දරන හිල්ඩා වර්ගයේ (දෙමළ) ගර්භිත යතුරු ලියන | 01 |
| 19. | 747885 දරන ඔප්ටිමා (ඉංග්‍රීසි) ගර්භිත යතුරු ලියන | 01 |
| 20. | 892162 දරන ඔප්ටිමා (සිංහල) ගර්භිත යතුරු ලියන | 01 |

10-02

## රජයේ නොවන දැන්වීම්

**ඇටෝර්නි බලය අවලංගු කිරීම**

වත්තල ශාන්ත ආනා පාර, අංක 36 හි පදිංචි අලුත්දූර පුන්සිරි සුදර්ශන් ගුණසේකර වන මම, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එල්. ඩබ්. ඒ. ඩී. එල්. නන්දසේන මිය විසින් වර්ෂ 2008ක් වූ ජනවාරි මස 23 වැනි දින ලියා සහතික කරන ලද අංක 02 දරන ඇටෝර්නි බලපත්‍රයෙන් අංක 30, ශාන්ත ආනා පාර, වත්තල හි පදිංචි අලුත්දූර ඇන්ස්ලම් වින්ස්ටන් ප්‍රනාන්දු ගුණසේකර යන අය වෙත පවරන ලද එකී ඇටෝර්නි බලය වර්ෂ 2009ක් වූ අගෝස්තු මස 14 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් ශ්‍රී ලංකාවාසී සියලු දෙනාටත් මෙයින් දැනුම් දෙමි.

අලුත්දූර පුන්සිරි සුදර්ශන් ගුණසේකර,

10-154

**දැන්වීමයි**

පහත විස්තර කරන ලද ව්‍යාපාර නම හා අංක දරන සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ ව්‍යාපාරයක් බව දැනුම් දෙමි.

1. සමාගමේ නම : ආර්. එෆ්. ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සංස්ථාගත කළ දිනය : 2009 සැප්තැම්බර් මස 01
3. සමාගමේ අංකය : පී. වී. 69006
4. ලියාපදිංචි ලිපිනය : අංක 27/1, පීටර්සන් පටුමග, වැල්ලවත්ත.

ලේකම්,
එකවුන්ටිං ඇන්ඩ් ඇලයිඩ් සර්විසස්
(ප්‍රයිවට් ලිමිටඩ්)

අංක 67 ඒ, ඩේවිඩ්සන් පාර,
කොළඹ 04.
10-186

**දැන්වීමයි**

පහත සඳහන් සමාගම ලියාපදිංචි කිරීම පිළිබඳව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

සමාගමේ නම : යසිත එන්ටර්ප්‍රයිසස් (පීවීටී) එල්. ටී. ඩී.
සමාගමේ අංකය : පී. වී. 68607
ලියාපදිංචි කාර්යාලය : අංක 114, බරිගම පාර, හල්ලොලුව, මහනුවර.
ඉහත කී සමාගම වෙනුවෙන්,

හඟුරන්ගොඩගේ ධම්මික සෝමසිරි.

10-108

**දැන්වීමයි**

පහත විස්තර කරන ලද ව්‍යාපාර නම හා අංක දරන සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ ව්‍යාපාරයක් බව දැනුම් දෙමි.

1. සමාගමේ නම : ජී. ටී. අයි. ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සංස්ථාගත කළ දිනය : 2009 සැප්තැම්බර් මස 08
3. සමාගමේ අංකය : පී. වී. 69080
4. ලියාපදිංචි ලිපිනය : අංක 110/1, ශ්‍රී සරණංකර පාර, කළුබෝවිල, දෙහිවල.

ලේකම්,
එකවුන්ටිං ඇන්ඩ් ඇලයිඩ් සර්විසස්
(ප්‍රයිවට් ලිමටඩ්)

අංක 67 ඒ, ඩේවිඩ්සන් පාර,
කොළඹ 04.
10-185

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 වගන්තිය ප්‍රකාරව පහත සමාගම 2009 ජූලි 17 වැනි දින සංස්ථාගත කරන ලදී.
සමාගමේ නම : මියාමි රිසෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 68479
ලියාපදිංචි ලිපිනය : අංක 52, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
කෝපරේට් සර්විසස් ලිමිටඩ්,
සමාගමේ ලේකම්වරු.

10-55

**ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නයිනමඩම, නැගෙනහිර නයිනමඩම, 'ප්‍රදීපා' හි පදිංචි වර්ණකුලසූරිය පෝකස් තිසේරා වන මම, ඩෙන්සිල් ෆොන්සේකා ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 1999 පෙබරවාරි මස 14 වැනි දින ලියා සහතික කළ අංක 14783 දරන ඇටර්නි බලපත්‍රයෙන් නයිනමඩම, නැගෙනහිර නයිනමඩම, 'ප්‍රදීපා' හි පදිංචි කළුබණ්ඩාගේ අබේසිංහ හට දෙන ලද ඇටර්නි බලය අවලංගු කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

ප්‍රියන්ත රාජපක්ෂ,
නීතිඥ.

2009 සැප්තැම්බර් 16 වැනි දින.
10-120

**ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම**

කොළඹ 15, මෝදර වීදිය, අංක 141/10 දරන ස්ථානයෙහි පදිංචි ජා. හැ. අං. 330972165 V හිමි රන්මුතුගල ලමප්පුගේ සිරිල් වින්සන් ප්‍රනාන්දු වන මා විසින් මාගේ විශේෂ ඇටෝර්නි බලකරු වශයෙන් ගනේමුල්ල, රාගම පාර, නුගහේනවත්ත, අංක 159/5/බී හි පදිංචි රන්මුතුගල ලමප්පුගේ ලීලාවතී ප්‍රින්සි බර්නදෙත් යන අය ගනේමුල්ල, නැදුන, රණසිංහ පාර, අංක 433/4 හි පදිංචි කෝරල ගමගේ නිෂානි සෝභා කෝරලගම ප්‍ර. නො. තැන විසින් ලියා සහතික කළ අංක 344 සහ 2007.02.25 වැනි දින දරන විශේෂ ඇටෝර්නි බලපත්‍ර මගින් පත්කර ඇත. මෙකී ඇටෝර්නි බලපත්‍රය මා විසින් 2009.08.11 වැනි දින සිට බලරහිත කරමින් අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ. එසේ හෙයින් මින් ඉදිරියට මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් රන්මුතුගල ලමප්පුගේ ලීලාවතී ප්‍රින්සි බර්නදෙත් යන අය මා වෙනුවෙන් කරනු ලබන කිසිම පැවරීමක්, විකිණීමක්, උකස් කිරීමක්, අන්සතු කිරීමක් හෝ වෙනයම් ඕනෑම ක්‍රියාවක් වලංගු නොවන අතර ඒ සම්බන්ධයෙන් මා වග නොකියන බව ද මෙයින් ප්‍රකාශ කර සිටිමි.

රන්මුතුගල ලමප්පුගේ සිරිල් වින්සන් ප්‍රනාන්දු.

2009 අගෝස්තු මස 11 වැනි දින.
10-54

**සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය
සමාගමේ නම : සොෆ්ට්‍රිංග්ස් ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී. වී. 69142
සංස්ථාගත කළ දිනය : 2009.09.11
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 130, ඒ. ඩී. එස්. සේනානායක වීදිය, හිල්සිටි කොම්ප්ලෙක්ස්, නුවර.

සීමාසහිත අමල්ගමේටඩ් මැනේජ්මන්ට් සර්විසස් (පෞද්ගලික)
ලේකම්වරු.

2009 සැප්තැම්බර් මස 15 වැනි දින,
අංක 96 - 2/2, මල්වත්ත පාර, කොළඹ 11.
10-153

**ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම**

කඩවත, ඇල්දෙනිය අංක 534/2/ඩී දරන ස්ථානයේ පදිංචි විජේවර්ධනලාගේ අජිත් කුමාර වන මා ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඉනෝෂිකා ඒකනායක මහත්මිය ලියා සහතික කළ අංක 358 සහ 2006.08.14 දිනැති ඇටර්නි බලපත්‍රයේ අඩංගු කරුණු ඉටුකිරීමට මාගේ ඇටර්නි බලකරු ලෙස ඉහත ලිපිනයේම පදිංචි විජේවර්ධනලාගේ ගුණපාල යන අය පත්කරනු ලැබූ ඇටර්නි බලපත්‍රය වර්ෂ 2009 ක් වූ සැප්තැම්බර් මස 10 වැනි දින සිට අවලංගු කරන ලද බවත්, එය මෙතැන් සිට බලපැවැත්මක් නොමැති බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.
10-84

**සමාගම් නාමය වෙනස් කිරීම**

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(2) වැනි වගන්තිය යටතේ මහජනයා වෙත කරන දැන්වීමයි

නව සමාගම් නාමය : ලංකා මීරිගම ස්පෙෂල් ඉකොනොමික් සෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්
කලින් ව්‍යවහාර වූ නාමය : වයිනා ලංකා ඉන්ඩස්ට්‍රියල් පාක් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 68235
දිනය : 2009 සැප්තැම්බර් මස 09
කාර්යාල ලිපිනය : ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය බාරේ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, බටහිර කුලුණ, 24 වැනි මහල, ඊචලොන් චතුරස්‍රය, කොළඹ 01.

එල්එම් මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

10-104

**සීමාසහිත සමාගමක් ස්ථාපිත කිරීම**

2007 සමාගම් ලියාපදිංචි කිරීමේ අංක 7 දරන ඡේදය අනුව මහජනයා වෙත කරන නිවේදනයයි

සමාගමේ නම : ප්‍රධාන ඩිවලොප්මන්ට් (පීවීටී) එල්ටීඩී

ලියාපදිංචි අංකය : PV68713

ලියාපදිංචි ලිපිනය : 97/1, පැපිලියාන පාර, නැදිමාල, දෙහිවල.

සංස්ථාගත කිරීමේ දිනය : 2009 අගෝස්තු මස 07

සමාගම් ලේකම්.

10-26

**මහජනතාව වෙත දැනුම් දීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2009 සැප්තැම්බර් මස 07 වැනිදා පිහිටු වූ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : යුනිවර්සල් මැරින් ප්‍රයිවට් ලිමිටඩ්

සමාගමේ අංකය : පී. වී. 69061

ලියාපදිංචි කාර්යාලය : අංක 28, ඔර්ස් හිල්ස්, ත්‍රිකුණාමලය.

යුනිවර්සල් මැරින් ප්‍රයිවට් ලිමිටඩ්,
සමාගම් ලේකම්වරුන්,

අංක 28, ඔරිස් හිල්ස්, ත්‍රිකුණාමලය.

10-103

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ස්පීඩ් ජ්ලස් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

ලියාපදිංචි කළ දිනය : 2009.08.14

සමාගමේ අංකය : පී. වී. 68748

ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 45, දේවාල පාර, කටුබැද්ද, මොරටුව.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

සමාගම් ලේකම්.

10-178

## වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව**

ණය අංකය : 0300001899.

ණයකරුගේ සම්පූර්ණ නම : විමලසේන අබේකෝන්.

(මෙහි මින් මතු 'බැංකුව' යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා) පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2009.02.13 වැනි දින අංක 1589 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2009.02.16 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම් පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 228/ඒ, වලව්වත්ත, කැස්බෑව ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඒ. එස්. ලියනගේ විසින් 2009.10.29 වන දින ප. ව. 1.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ පනස්හතරදහස් අටසිය අනූපහයි ශත විස්සක (රු. 3,54,895.20) මුදල වර්ෂ 2008.07.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් තුන්ලක්ෂ දහතුන්දහස් පන්සිය විසිඑකයි ශත අසූහතරක (රු. 3,13,521.84) මුදල ද, 2008.07.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් හතලිස්එක්දහස් තුන්සිය හැත්තෑතුනයි ශත තිස්හයක් (රු. 41,373.36) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් තුන් ලක්ෂ පනස්හතරදහස් අටසිය අනූපහයි ශත විස්සක (රු. 3,54,895.20) ද,

(2) එකී රුපියල් තුන්ලක්ෂ දහතුන්දහස් පන්සිය විසිඑකයි ශත අසූහතරක (රු. 3,13,521.84) මුදල මත අයවිය යුතු වර්ෂයකට 13.50% බැගින් වන පොලියක් 2008.08.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුනේ, කළුතර බද්ද, කළුතර ප්‍රාදේශීය සභා සීමාවේ, පලාතොට පිහිටි පලාතොට එස්ටේට් හෙවත් හැමිදිරියා එස්ටේට් (ඔප්පුවට අනුව පලාතොට එස්ටේට් හෙවත් හැමිදිරියාව එස්ටේට් නමුත් වඩාත් නිවැරදිව පලාතොටවත්ත හෙවත් හැමිදිරියාවත්ත සහ හැමිදිරියාවකුඹුර) නැමැති ඉඩම 1990.12.04 වැනි දින එල්. ඩබ්. එල්. ද සිල්වා බලයලත් මානක තැන විසින් මැන සකසන ලද අංක 8434 පිඹුර ප්‍රකාර ලොට් 38 ට මායිම්, උතුරට : ලොට් 37 ද, නැගෙනහිරට : අඩි 15 ක් පළල පාර සඳහා වෙන් කරන ලද කොටසෙන් (ලොට් 98) ද, දකුණට : ලොට් 39 සහ බටහිරට : ලොට් 33 ද යන මායිම් තුල පිහිටි පර්චස් දහහතර (අක්.0, රූඩ්.0, පර්. 14) ක වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද, මාර්ග පරවශතාවය ද සමග කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G132/251 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2009 ක්වූ සැප්තැම්බර් මස 16 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

10-207

---

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව**

ණය අංකය : 0300002097.

ණයකරුගේ සම්පූර්ණ නම : කම්මන්තිගේ අජිත් කුමාරසිරි සහ රෙටියලාගේ ඉන්ද්‍රානි.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා) පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2009.08.07 වන දින අංක 1614 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2009.08.07 වන දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම් පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 228/ඒ, වලව්වත්ත, කැස්බෑව ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඒ. එස්. ලියනගේ විසින් 2009.10.30 වන දින පෙ. ව. 10.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් හයලක්ෂ පනස්හත්දහස් හත්සියදාසයයි ශත අනූඅටක (රු. 6,57,716.98) මුදලක් වර්ෂ 2008.03.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් පන්ලක්ෂ අටදහස් එකසිය හතයි ශත හතළිස්තුනක (රු. 5,08,107.43) මුදල ද, 2008.03.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් එක්ලක්ෂ හතළිස්නමදහස් හයසිය නමයයි ශත පනස්පහක් (රු. 1,49,609.55) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හයලක්ෂ පනස්හත්දහස් හත්සියදාසයයි ශත අනූඅටක් (රු. 6,57,716.98) ද,

(2) එකී රුපියල් පන්ලක්ෂ අටදහස් එකසිය හතයි ශත හතළිස්තුනක (රු. 5,08,107.43) මුදල මත අයවිය යුතු වර්ෂයකට 20.90% බැගින් වන පොලියක් 2008.04.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බටහිර දොඩංගොඩ කළුතර බද්දහි උතුරු කළුතර තොටමුණේ, බටහිර පස්දුන් කෝරළේ, ඉද්දගොඩ පත්තුවේ, බෝඹුවල ග්‍රාමයේ පිහිටි බටකුලිකැටිය ගොරකගහලන්දෙදෙනිය, ගොරකගහලන්ද, බටකුලිකැටියෙලන්ද හෙවත් දෙල්ගස්ලන්දෙකැලේ, කජුගහ කැලේ, ගල්ලෙඋඩුමුල්ලෙ දෙනිය සහ බටකුලිකැටිය හෙවත් දෙල්ගස්ලන්දෙකැලේ නැමැති ඉඩමට 1998.11.01 වන දින කේ. ඩී. පී. වීරසිංහ බලයලත් මානක තැන විසින් මැන සකසන ලද අංක 1525 පිඹුර ප්‍රකාර ලොට් 11 ට මායිම්, උතුරට : ලොට් 10 සහ R5 න් ද, නැගෙනහිරට: ලොට් R5 සහ R12 ද, දකුණට : ලොට් 12 සහ R2 ද සහ බටහිරට : ලොට් R2 සහ 10 ද යන මායිම් තුල පිහිටි පර්චස් දොළහයි දශම අටයි නවය (අක්. 0, රූඩ් 0, පර්. 12.89) ක වපසරියකින් යුතු මෙම ඉඩම ඊට අයත් සියළුදේද, මාර්ග පරවශතාවය ද සමග කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G196/150 සහ මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 357/04 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2009 ක්වූ සැප්තැම්බර් මස 16 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

10-208

---

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව**

ණය අංකය : 0404400025.

ණයකරුගේ සම්පූර්ණ නම : සින්නයියා කාලිමුතු සිවකුමාර්.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා) පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2008.11.21 වැනි දින අංක 1575 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2008.11.21 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම් පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 83/5, බෝමළුව පාර, වටපුලුව, මහනුවර යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මයා විසින් 2009.11.03 වන දින පෙ. ව. 10.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ අසූහයදහස් නමසිය තිහයි ශත හතරක (රු. 3,86,930.04) මුදලක් වර්ෂ 2008.07.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ දෙදහස් අටසිය විසිදෙකයි ශත අනූහතරක (රු. 2,02,822.94) මුදල ද, 2008.07.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් එක්ලක්ෂ අසූහතරදහස් එකසියහතයි ශත දහයක් (රු. 1,84,107.10) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් තුන්ලක්ෂ අසූහයදහස් නමසිය තිහයි ශත හතරක (රු. 3,86,930.04) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ දෙදහස් අටසිය විසිදෙකයි ශත අනූහතරක (රු. 2,02,822.94) මුදල මත අයවිය යුතු වර්ෂයකට 16.50% බැගින් වන පොලියක් 2008.08.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට,

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර පල්ලේගම්පහ කෝරළේ පාතදුම්බර ප්‍රාදේශීය සභා සීමාවේ වරකගස්තැන්නෙහි පිහිටි ඉන්එස්ටෙලි වතුයාය නමැති ඉඩමට 1985.02.05 හා 1987.01.19 දින ඒ. බී. වීරසේකර මානක තැන විසින් මැන සාදන ලද අංක 2466 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 13 ට මායිම්, උතුරට : කැබලි අංක 16 ද, නැගෙනහිරට: කැබලි අංක 25 ලකුණු කරන ලද අඩි පාර ද, දකුණට : කැබලි අංක 12 ද, බටහිරට: කැබලි අංක 14 සහ 15 ද යන මායිම් තුළ පිහිටි පර්චස් විසි තුනක (අ. 0, රූ. 0, පර්. 23) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද මාර්ග අයිතිය ද සමග මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E 567/214 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2009 ක්වූ සැප්තැම්බර් මස 16 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

10-206

---

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව**

ණය අංකය : 0502300018.

ණයකරුගේ සම්පූර්ණ නම : විජයවංශ කිත්සිරි බණ්ඩාරගේ ධර්මසිරි විජේබණ්ඩාර.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා) පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2005.01.28 වන දින අංක 1378 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2005.02.10 වන දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම් පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 83/5, බෝමළුව පාර, වටපුලුව, මහනුවර යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මයා විසින් 2009.10.30 වන දින පෙ. ව. 10.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ තිස්දහස් එකසිය එකයි ශත විසිඑකක (රු. 1,30,101.21) මුදලක් වර්ෂ 2002.08.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හැත්තෑපන්දහසක (රු. 75,000.00) මුදල ද, 2002.08.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් පනස්පන්දහස් එකසිය එකයි ශත විසිඑකක් (රු. 55,101.21) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ තිස්දහස් එකසිය එකයි ශත විසිඑකක් (රු. 1,30,101.21) ද,

(2) එකී රුපියල් හැත්තෑපන්දහසක (රු. 75,000.00) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17.00%, 6.00% බැගින් වන පොලියක් 2002.09.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

**දේපළ පිළිබඳ විස්තරය**

